# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් කැඳවනු ලැබේ.

**01. ලේකම් තනතුර - තනතුර 01**

**අධ්‍යාපන සුදුසුකම් :**

*බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් :*

i. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් නීතිය පිළිබඳව සාමාන්‍ය උපාධියක් ලබා තිබිය යුතුය ;

ii. විශ්වවිද්‍යාලීය උපාධිය ලබාගැනීමෙන් පසුව තනතුර හා සම්බන්ධ විෂයය ක්ෂේත්‍රයක යටත් පිරිසෙයින් එක් අවුරුද්දක පළපුරුද්දක්වත් ලබා තිබීම ;

*හෝ*

iii. පිළිගත් වෘත්තීයමය වරලත් ආයතනයකින් නීතිය පිළිබඳව වෘත්තීය සුදුසුකමක් ලබා ගැනීමෙන් පසු තනතුර හා සම්බන්ධ විෂයය ක්ෂේත්‍රයක යටත් පිරිසෙයින් එක් අවුරුද්දක පළපුරුද්දක්වත් ලබා තිබීම.

**වැටුප් පරිමාණය :**

M. M. 1-3-2016 : රුපියල් (55,925-10x1,375-15x1,910-රු.98,325)

02. **පර්යේෂණ නිලධාරි තනතුර - තනතුරු 01**

**අධ්‍යාපන සුදුසුකම් :**

*බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් :*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් නීතිය පිළිබඳව සාමාන්‍ය උපාධියක් තිබිය යුතු අතර අධ්‍යයන පර්යේෂණ හෝ නීති ක්ෂේත්‍රය පිළිබඳව යටත් පිරිසෙයින් වසරක පළපුරුද්දක් සහිත ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥයෙකු විය යුතුය.

*වැටුප් පරිමාණය :*

A. R. 1-2016 : රුපියල් (51,285- 5 x 1,135 - 5 x 1,335 - 15 x 1,590-රු. 87,485)

**03. පුස්තකාලයාධිපති තනතුර - තනතුරු 01**

**අධ්‍යාපන සුදුසුකම් :**

*බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් :*

i. සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා තුනෙන් එකකට අ. පො. ස. (සා/පෙළ) විභාගයේ දී සම්මාන සාමාර්ථයක් තිබීම.

ii. ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයන් 06කින් අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත් වීම. මින් විෂයයන් 5ක් වත් එකවර සමත්ව තිබීම ;

ඊට අමතරව අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයන් තුනක් (03) සමත්ව තිබීම ;

iii. පිළිගත් විශ්වවිද්‍යාලයක පුස්තකාල විද්‍යාව පිළිබඳව තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම හෝ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල විද්‍යාව පිළිබඳව තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම හෝ ජාතික වෘත්තීය කුසලතා (NVQ) 05 වන මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීනතාවක් ලබා තිබීම.

*වැටුප් පරිමාණය :*

M. A. 2-2-2016 : රුපියල් (30,310 - 10 x 300 - 7 x 350 - 4 - 600 - 20 x 710 - රු. 52,360)

**04. මෘදුකාංග සහ දෘඩාංග තාක්ෂණ ශිල්පී තනතුර - තනතුරු 02**

**අධ්‍යාපන සුදුසුකම් :**

*බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් :*

i. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් මෘදුකාංග හා දෘඩාංග තාක්ෂණය පිළිබඳව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 05 වන මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීනතාවක් ලබා තිබීම ;

සහ

ii. සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

*වැටුප් පරිමාණය :*

M. A. 2-2-2016 : රුපියල් (30,310 - 10 x 300 - 7 x 350 - 4 x 600 - 20 x 710 - රු. 52,360)

**05. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) - තනතුරු 02**

අධ්‍යාපන සුදුසුකම් :

*බාහිර අයදුම්කරුවන් :*

i. සිංහල/දෙමළ, ඉංග්‍රීසි, ගණිතය ඇතුළු අවම වශයෙන් විෂයයන් 04කට සම්මාන සහිතව අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් එක වරක දී විෂයයන් හයක් (06) සමත්ව තිබීම ;

*සහ*

ii. අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයන් තුනක් (03) සමත්ව තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර).

*අභ්‍යන්තර අයදුම්කරුවන් :*

පහත සුදුසුකම් සම්පූර්ණ කරන ලද ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයට අයත් සේවකයන්

i. සිංහල/දෙමළ, ඉංග්‍රීසි, ගණිතය ඇතුළු අවම වශයෙන් විෂයයන් 04කට සම්මාන සහිතව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් එක වරකදී විෂයයන් හයක් (06) සමත්ව තිබීම. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් ආයතනයකින් ලබාගත් පරිගණක යතුරු ලියනය හෝ වෙනත් එවැනි ක්ෂේත්‍රයක් පිළිබඳව පාඨමාලාවක් හදාරා තිබීම අමතර සුදුසුකමක් ලෙස පිළිගැනේ.

ii. වර්තමාන තනතුරේ සේවය ස්ථිර කර තිබීම.

iii. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට වසර පහක අඛණ්ඩ කාලයක් සඳහා ස්ථිර තනතුරක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

*වැටුප් පරිමාණය*

M. A. 1-2-2016 : රුපියල් (27,910 - 10 x 300 - 7 x 350 - 12 x 600 - 12 x 710 - රු. 49,080)

**06. රියදුරු තනතුර - තනතුරු 03**

**අධ්‍යාපන සුදුසුකම්**

*බාහිර අයදුම්කරුවන්*

i. අ. පො. ස. (සා./පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත්ව තිබීම, සහ

ii. බරවාහන සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ බලපත්‍රය ලබා තිබීම. බරවාහන බලපත්‍ර ලබාගැනීමෙන් පසුව අවුරුදු තුනක (03) පළපුරුද්ද ලබා තිබීම. (සහතික ඉදිරිපත් කළ යුතුවේ.)

*අභ්‍යන්තර අයදුම්කරුවන් :*

i. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රයක් ලබා තිබීමෙන් පසු රිය පැදවීම පිළිබඳ අවම වශයෙන් වසර තුනක (03) පලපුරුද්ද ලබා තිබීම;

ii. ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL-2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL-1) සේවා ගණයක වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

*වැටුප් පරිමාණය*

P. L. 3 - 2016 : (රු. 26,290-10x270-10x300-10x330-12x350- රු. 39,490)

*සෑම අයදුම්කරුවෙකු ම*

i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ii. තනතුරට අදාළ රාජකාරි මනාව ඉටු කිරීමට සේවය කිරීමට කායික හා මානසික වශයෙන් යෝග්‍ය විය යුතුය.

iii. මනා චරිතයකින් යුක්ත පුද්ගලයෙකු විය යුතුය.

*වයස් සීමාව :*

ලේකම් සහ පර්යේෂණ නිලධාරී තනතුරු සඳහා අයදුම්කරන අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

අනෙකුත් තනතුරු සඳහා අයදුම්කරන අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

*අනෙකුත් දීමනා :*

ජීවන වියදම් දීමනාව සහ රජයෙන් අනුමත අනෙකුත් දීමනා

*බඳවා ගැනීමේ ක්‍රමය :*

ඉහත සඳහන් මූලික සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් අතුරෙන් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගන්නා ලකුණු අනුපිළිවෙළ අනුව බඳවාගැනීම් සිදුකරනු ලැබේ. මීට අමතරව රියදුරු තනතුර සඳහා අයදුම්කරනු ලබන අයදුම්කරුවන් හට ප්‍රායෝගික පරීක්ෂණයක් ද පවත්වනු ලැබේ.

*සේවා කොන්දේසි :*

- මෙම තනතුරු ස්ථිරය. වසර 03ක පරිවාස කාලයකට යටත් වේ.
- *සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල :* සේවකයා තම වැටුපෙන් 8% ප්‍රමාණයකින් හා සේවා යෝජකයා 12% ප්‍රමාණයකින් සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක වේ. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා 3% ප්‍රමාණයකින් සේවායෝජකයා ගෙවනු ලබයි.

*අයදුම් කිරීමේ පිළිවෙල :*

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වෙබ් අඩවියේ <http://www.judgesinstitute.lk/> පළකර ඇති ආදර්ශ අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර **2024.10.02** වැනි දිනට හෝ එදිනට පෙර පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතුය. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් හා අයදුම්පත් බාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද තැපෑලේ දී නැති වූ බවට ඉදිරිපත් කරනු ලබන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

අයදුම්පත් බහාලන ලියුම් කවරයේ ඉහල වම් කෙලවරේ අයදුම්කරන තනතුරු නාමය සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය.

අංක 80 (5 වන හා 6 වන මහල),
අධිකරණ මාවත,
කොළඹ 12.